IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජනවාරි)

## BLE 201 - සාර්ව ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(2) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. සාර්ව ආර්ථික විද්‍යාව සූක්ෂම ආර්ථික විද්‍යාවෙන් වෙනස්වන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. "සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ ඓතිහාසික විකාශනයේදී නව සම්භාව්‍යවාදීන්ගේ දායකත්වය මෙන්ම නව කේන්සියානු ආර්ථික විද්‍යාවේ දායකත්වයද වැදගත් වේ". මෙම ගුරුකුල දෙකෙහි දායකත්වය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 07)

iii. "සාර්ව ආර්ථික අරමුණු සෑම ආර්ථිකයකටම පොදු වුවද එක් එක් ආර්ථිකයන් ඒවාට දෙන මූලිකත්වය වෙනස්විය හැකිය". ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අරමුණු එහි මූලිකත්වය අනුව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02.

i. "ආර්ථික කටයුතු හේතුකොටගෙන බිහිවන්නා වූ මූර්ත ප්‍රවාහයන්ගේ අගයට සමාන අගයකින් යුතු මූල්‍ය ප්‍රවාහයන් සැමවිට බිහිවනු දක්නට හැකිය".

a) මූර්ත සහ මූල්‍ය ප්‍රවාහයන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

b) ඔබ ඉහත (i) ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර හේතු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. අංශ හතරකින් යුතු ආර්ථිකයක විදීම් හා කාන්දුවීම් ආශ්‍රයෙන් වෙළඳ ශේෂය පැහැදිලි කරන්නේ කෙසේද? වෙළඳ ශේෂය චක්‍රීය ප්‍රවාහයට බලපාන්නේ කෙසේද?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03.

i. ජාතික ගිණුම් සකස්කිරීමේදී "එකතුකල අගය" ලෙස අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03)

ii.

a) වැයකල හැකි ආදායම (Disposable Income) ලෙස හඳුන්වන්නේ කුමක්ද?

(ලකුණු 03)

b) එය ලබාගැනීම සඳහා ශුද්ධ ජාතික නිෂ්පාදිතයට කලයුතු ගැලපීම් මොනවාද?

(ලකුණු 04)

iii. අංශ 02 කින් යුත් කල්පිත ආර්ථිකයක යම් දෙන ලද කාලච්ඡේදයක් තුලදී කුටුම්භයක් විසින් රු. බිලියන 50 ක අනිවාර්ය පාරිභෝජනයක් සිදුකරනු ලබන අතර ඊට අමතරව වැඩිවන ආදායමෙන් 80% ක් පාරිභෝජනය සඳහා වැය කරයි. එම ආර්ථිකයේ ව්‍යාපාරික අංශය අදාල කාලච්ඡේදය තුලදී රු. බිලියන 50 ක ආයෝජනයක් සිදුකර ඇත.

a) ඉතුරුම් හා ආයෝජන ප්‍රවේශය භාවිතයෙන් ජාතික ආදායම නිර්ණය කරන්න.

(ලකුණු 06)

b) සමතුලිතයේදී පරිභෝජනය සහ ආයෝජනය කොපමණද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

04.

i. කිසියම් ආර්ථිකයක ආයෝජනය සෘජු විදේශ ආයෝජන හේතුකොටගෙන දෙන ලද කාලච්ඡේදයක් තුලදී රු. මිලියන 100 සිට රු. මිලියන 200 දක්වා ඉහල ගියේය. එම කාලච්ඡේදය තුලදී ආන්තික පරිභෝජන නැඹියාව (MPC) 0.8 ක් ලෙස නිරීක්ෂණය කරන ලදී.

a) ආර්ථිකයේ අනිකුත් සාධක නොවෙනස්ව පවතියයි උපකල්පනය කලහොත් ජාතික ආදායමේ වැඩිවීම කොපමණද?

(ලකුණු 02)

b) ඉහත ජාතික ආදායමේ වැඩිවීම (a) ගුණන ක්‍රියාවලිය ආධාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. අංශ තුනකින් යුතු ආර්ථිකයක රජය විසින් එකවර බදු (Lump Sum Tax) වලට අමතරව සමානුපාතික ආදායම් බද්දක් (Proporational Income Tax) අයකරනු ලැබීය. රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම හේතුකොටගෙන සමානුපාතික ආදායම් බද්ධ සම්පූර්ණයෙන්ම ඉවත්කරනු ලැබුවේ නම්,

a) ගුණකය වෙනස්වන්නේ කෙසේද?

(ලකුණු 03)

b) එම තීරණය සමතුලිත ජාතික ආදායම කෙරෙහි බලපාන්නේ කෙසේද?

(ලකුණු 04)

iii. කිසියම් රටක ආනයන තීරණය කර සාධක තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

05. කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථිකය සම්බන්ධ ඇස්තමේන්තුගත දත්තයන් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ස්ථාවර පරිභොජනය | $\dot{C}$ | = | 200 |
| ආන්තික පරිභෝජන නැම්යාව | (MPC) | = | 0.8yd (yd = වැයකල හැකි ආදායම) |
| බදු ශිතය | T | = | 100 + 0.05y |
| අපනයන | (X) | = | 50 |
| ස්ථාවර ආනයන | ($\dot{M}$) | = | 20 |
| ආන්තික ආනයන නැම්යාව | | = | 0.01y |
| ආයෝජනය | (I) | = | 150 |
| රජයේ වියදම | (G) | = | 80 |
| රජයේ සංක්‍රම වියදම | (GTR) | = | 50 |

i. සමහාර ඉල්ලුම් ශිතය ගොඩනගන්න.

(ලකුණු 05)

ii. සමතුලිතයේදී ජාතික ආදායම කොපමණද?

(ලකුණු 04)

iii. සමතුලිතයේදී අයවැය හිඟය / අතිරික්තය කොපමණද?

(ලකුණු 04)

iv. රාජ්‍ය ප්‍රතිපත්ති හේතුකොටගෙන ආයෝජන වල වටිනාකම 20 කින් අඩුවූයේ නම්, නව සමතුලිත ජාතික ආදායම කොපමණද?

(ලකුණු 03)

v. නව සමතුලිතයේදී වෙළඳ හිඟය / අතිරික්තය කොපමණද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

06.

i. "බාටර් යුගයෙන් පසු මිනිසුන් විසින් වටිනා ලෝහ වර්ග වලින් තැනූ කාසි භාවිතයට ගනු ලැබූ අතර වර්තමානයේදී රජය විසින් බලාත්මක කරනු ලබන නෝට්ටු මුදල් (Paper Money) භාවිතා කරයි".

a). බාටර් ක්‍රමය (Barter System) ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03)

b) වර්තමානයේ භාවිතා කරනු ලබන නෝට්ටු මුදල් භාවිතය වැඩිවීමට හේතු මොනවාද?

(ලකුණු 04)

ii. "කල්පසුවූ ගෙවුම් මාධ්‍යයක්" (Standard of deffered payment) ලෙස මුදලේ කාර්යභාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. නූතන ආර්ථිකයේ (Modern Economy) මුදලේ කාර්යභාරය සැකවින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

07.

i. "ෆිෂර් (Fisher) ට අනුව ආර්ථිකයක මුදල් ප්‍රමාණය හා එම ආර්ථිකයේ මිල මට්ටම අතර යම් සම්බන්ධතාවයක් පවතී".

a) මුදලේ සංසරණ ප්‍රවේගය ලෙස ඔබ කුමක් අදහස් කරන්නේද?

(ලකුණු 03)

b) ෆිෂර් (Fisher) ට අනුව මුදල් ප්‍රමාන වාදය (Quantity theory of money) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. සම්භාව්‍ය ගුරුකුලයට අනුව පොලී අනුපාත පිළිබඳ න්‍යාය (The theory of interest) රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "මුදල් සහ පොලිය පිළිබඳ කේන්සියානු න්‍යායට අනුව ගණුදෙනු චේතනාව වෙනුවෙන් මුදලට කරනු ලබන ඉල්ලුම ආදායමට සංවේදී වුවද පොලියට සංවේදී වන්නේ ඉතාම අඩුවෙනි". රූප සටහන් ආධාරයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

*******************************